# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss – 2022)

(11 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නාට්‍ය හා රංග කලාව

## 11 ශ්‍රේණිය - තෙවන වාරය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| **11 ශ්‍රේණිය පළමු තෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | |
| 2. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි. | 2.10. පෙළ රංගයක් බවට පත්කරයි. | ■ ''කෙටි නාට්‍ය සංකල්පය'' යන්න නිර්වචනය කරයි.<br>■ කෙටි නාට්‍යයෙහි සුවිශේෂතා විස්තර කරයි.<br>■ සුදුසු තේමාවන් රැස් කරයි.<br>■ කෙටි නාට්‍ය පෙළක් රචනා කරයි.<br>• ලියන ලද පිටපත නිෂ්පාදනයක් වශයෙන් ඉදිරිපත් කරයි. | ■ කෙටි නාට්‍ය සංකල්පය පැහැදිලි කිරීම.<br>■ කෙටි නාට්‍යයෙහි සුවිශේෂතා<br>■ කෙටි නාට්‍ය පෙළ රචනය | 2.10 කෙටි නාට්‍යයක් රචනය කර නිෂ්පාදනය කිරීම | 08 |
| 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි. | 3.6 නව නාට්‍ය පෙළ නිෂ්පාදනය කරයි. | ■ රංගභූමියේ ප්‍රධාන බෙදීම් පැහැදිලි කරයි.<br>■ රංගනයේ දී වේදිකාව භාවිත කරන අයුරු දක්වයි.<br>■ භූගෝලීය වශයෙන් රංගභූමිය කොටස් 09 (නවය) ලෙස දැක්වීම මනඃකල්පිත වුව ද හොඳ ප්‍රේක්ෂාවක් ලබා දීමට මෙය ඉවහල් වන ආකාරය පැහැදිලි කරයි.<br>■ රංගභූමියේ පසුතල නිර්මාණ තිර භාවිතය පිළිබඳව දක්වයි. | ■ රංගභූමියේ ප්‍රබල ස්ථාන<br>■ රංගභූමියේ කල්පිත බෙදීම් හා නිසි ලෙස ස්ථානගත වීම.<br>■ වේදිකාවේ සමබරතාව<br>■ ප්‍රේක්ෂාව ගොඩනැගීම<br>■ රංගභූමියේ පසුතල නිර්මාණ තිර භාවිතය | 3.6 රූපණයේදී රංග භූමිය භාවිත කළ යුතු අයුරු ප්‍රායෝගික ව අත්විඳීම. (සිද්ධාන්ත හා ප්‍රායෝගික) | 02 |
| 4. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.7 ශ්‍රී ලංකාවේ ප්‍රගමනයට දායක වූ රංග ශිල්පීන් පිළිබඳව විමසයි. | ■ ඡායාරූප ඇසුරින් චාන්දනී සෙනෙවිරත්න, මැණිකේ අත්තනායක, නීල් අලස් යන රංගන රංගන ශිල්පීන් හඳුනාගනියි.<br>■ ඔවුන්ගේ රංගන කුශලතා අගයයි.<br>■ ඔවුන් රඟපෑ නාට්‍ය නම් කරයි. | ■ චාන්දනී සෙනෙවිරත්න, මැණිකේ අත්තනායක, නීල් අලස් යන රංගන ශිලපීන් හඳුනාගැනීම.<br>■ ඔවුන්ගේ රංගන කුශලතා සාකච්ඡා කිරීම. ■ ඔවුන් රඟ පෑ නාට්‍ය<br>■ ඔවුන් ගේ රංගනයෙහි සුවිශේෂ | 4.7 ''රංගන ශිල්පීන් හඳුනාගනිමු''. (සිද්ධාන්ත ) | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ▪ චිත්‍රපට සහ රූපවාහිනී මාධ්‍යන්හි ඔවුන්ගේ රංගන දායකත්වය සාකච්ඡා කරයි. | | | |
| 5. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳගැනීම හා මානවහිතවාදියකු ලෙස සමාජගතවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 5.1 නිර්දිෂ්ට නාට්‍ය පෙළ සාමූහිකව රස විඳීම හා ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br><br>5.2 නිර්දිෂ්ට පෙළ හෝ වෙනත් පෙළක් නිෂ්පාදනයක ලෙස රස විඳියි. | ▪ යෞවන නාට්‍ය සංකල්පය හඳුන්වයි.<br>▪ විකෘති නාට්‍ය නිර්මාණය කිරීමට බලපෑ සමාජ පසුබිම හඳුනාගනියි.<br>▪ නාට්‍ය තේමාව සහ දෘෂ්ටිය වටහා ගනියි.<br>▪ චරිත හා අවස්ථා මගින් නාට්‍යයේ ගැටුම් කුළුගන්වන අයුරු විමසයි.<br>▪ විකෘති නාට්‍යයෙන් ප්‍රකාශිත තේමාව පැහැදිලි කරයි.<br>▪ නාට්‍ය රචනයේ ප්‍රබලතා සහ දුබලතා දක්වයි.<br>▪ නාට්‍යයේ රංග ශෛලියේ ස්වභාවය පැහැදිලි කරයි.<br>▪ භාෂා භාවිතය හා රංගෝචිත බව විස්තර කරයි. | ▪ යෞවන නාට්‍ය යනු කුමක් දැ යි විස්තර කිරීම.<br>▪ විකෘති නාට්‍යයේ ප්‍රධාන තේමාව, අතුරු තේමාවන් සහ දෘෂ්ටිය<br>▪ චරිත නිරූපණයේ ස්වභාවය<br>▪ විකෘති නාට්‍ය නූතන සමාජය හා සංසන්දනය<br>▪ විකෘති නාට්‍ය නිර්මාණය කිරීමට බලපෑ සමාජ පසුබිම | 5.1.1/5.2.1/5.2.2 විකෘති නාට්‍යය අධ්‍යයනය කිරීම. (සිද්ධාන්ත ) | 06 |